දිවි අහිමි කරගැනීම් පිළිබඳ පුවත් සමගින් උපකාරක අංක සඳහන් කිරීමද අත්‍යාවශ්‍ය කරුණක් යැයි වර්තමානයේදී හැඟී යන්නේ, ලෝකයේ දක්නට ලැබෙනා දිවි අහිමි කරගැනීම් සංඛ්‍යා දෙස බැලීමෙනි. සාමාන්‍යයෙන් සෑම තත්පර 40 කටම වරක් දිවි අහිමි කරගැනීමක් සිදුවන බව ලෝක සෞඛ්‍ය සංවිධානය දක්වයි.

දිවි අහිමි කරගැනීමේ පුවත් සමගින් උපකාරක අංක සඳහන් කරන මෙන් මාධ්‍යවේදීන් හට උදක්ම පැවසෙන්නේ, දිවි අහිමි කරගැනීම සඳහා නැඹුරුතාවයක් ඇති අයෙකුගේ දිවි ගලවා ගැනීමට ඉඩක් තිබීම නිසායි. බොහෝ ජාත්‍යන්තර මාධ්‍ය මෙය අනුගමනය කරන බවද පෙනී යයි.

උදාහරණයක් ලෙසින් පහත දැක්වෙන පුවත ගත හැක. මෙම පුවත දිවයින තුළ උපකාරක අංක නොමැතිව පළ වන විට, ද හින්දු පුවත්පත එම පුවතම උපකාරක අංකද සහිතව පළ කරයි.

එසේ මියගොස් ඇති පුද්ගලයා ඉන්දීය රහස් පොලිසියේ හිටපු ප්‍රධානියා වීම ඔස්සේ, දිවි අහිමි කරගැනීමට යොදාගත් ආකාරය මහජන බැඳියාවට අදාළ වේ යැයි ගත හැක. කෙසේ නමුත්, එය අපි ආවරණය කොට ඉදිරිපත් කරමු.

මූලාශ්‍ර:
https://www.who.int/.../preven.../suicide/suicideprevent/en/

https://apps.who.int/iris/bitstream/handle/10665/258814/WHO-MSD-MER-17.5-eng.pdf;jsessionid=D14833A4878E3B3D96D0721858FB5F4E?sequence=1&fbclid=IwAR3zHu-ZOeqdO6eiga3I9rW9bnHX-H0EYPD7QHCiLUZxDBOU2dmQTUa16F8https://accountablejournalism.org/ethics-codes/australia-standards-of-practice-suicide-reporting?fbclid=IwAR3fde9cEIsXqNz6QktfN9uUXW2CHRwMfxH_3vqMYN4nKyWVNhFh2DAJw74

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ -0112696666
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

**#MediaEthicsSL #lka #SinhalaPress #Divaina #TheHindu**